# 10. බෞද්ධ සන්නිවේදන විධි සහ උපායමාර්ග පිළිබඳ විමසුමක්

තිස්ස වීරසේකර, ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය , ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. E-mail- weerasekaratissa@yahoo.com


## සංක්ෂිප්තය

බුදුරජානන් වහන්සේගේ සන්නිවේදන ශක්‍යතාව, අනුපමේය බව පෙන්වා දෙන ප්‍රධාන සාධකයක් වන්නේ, වසර දෙදහස් හයසියයක් පමණ ගත වුවද උන්වහන්සේගේ ධර්මය නොකෙළසී පැවතීමයි. සන්නිවේදන ක්‍රමෝපායන් ගැන බුදුරජානන් වහන්සේගේ දැක්ම අද්විතීයය. නූතන සන්නිවේදකයන්ගේ සන්නිවේදන සංකල්ප සිද්ධාන්ත, ආකෘති ඉක්මවා ගිය සන්නිවේදන උපක්‍රම උන්වහන්සේගේ සන්නිවේදන විධික්‍රමය තුළ අන්තර්ගත විය. එම ක්‍රමෝපායන්ගේ විශිෂ්ටත්වය හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ මුඛ්‍ය පරමාර්ථය වෙයි. ප්‍රධාන වශයෙන් ත්‍රිපිටකයේ සංගෘහිත උදාහරණ නූතන සන්නිවේදන මතවාදයන්ට අනුව විමසා බැලීම මෙම අධ්‍යයනයේ විමර්ශන ක්‍රමවේදය වෙයි. ඒ අනුව නූතන සන්නිවේදනයේ වර්ගීකරනයක් වන අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ ඇතැම් සංකල්ප බෞද්ධ සූත්‍රවල සඳහන් ඇතැම් සන්නිවේදන සංකල්ප හා සංසන්දනය කිරීමද, පුද්ගලාන්තර සන්නිවේදනයේදි නිවේදක ග්‍රාහක මනෝ-භෞතික තත්ත්වයන් පිළිබඳ බෞද්ධ දේශනාවලදී භාවිත ක්‍රම ත්‍රිපිටකය මෙන්ම ජාතක කථා පොත ඇසුරින්ද විමසුමට ලක් කර ඇත. නූතන ජන සන්නිවේදන මාධ්‍ය මගින් කෙරෙන විරෝධාකල්ප ප්‍රචාරණය බුදුරජානන් වහන්සේ සන්නිවේදන උපායමාර්ගයක් වශයෙන් යොදාගත් ආකාරය මහාසාල සූත්‍රයෙන් විශද වෙයි. මේ හැරුන කල නූතන සන්නිවේදකයන්ගේ දැඩි අවධානයට ලක් නොවූ පුද්ගලාන්තර සන්නිවේදයේ දී ඇතැම් විට පැන නැගෙන ග්‍රාහක අධිමානය නැමැති බාධකයද සන්නිවේදනයේ ඇතැම් තහනම් කලාප පිළිබඳවද උන්වහන්සේගේ දෙසුම් ඇතුළත් සූත්‍ර මෙම ලිපිය තුළ විමසුමට ලක් කර ඇත. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් ත්‍රිපිටකය හා ජාතක පොත යොදා ගත් අතර බෞද්ධ සන්නිවේදනය පිළිබඳ ලියවුණු විද්වත් කෘති ද්විතීයික මූලාශ්‍ර වශයෙන් භාවිත කොට ඇත.


**යොමු වචන:** බෞද්ධ සන්නිවේදනය, සන්නිවේදන උපායමාර්ග, නූතන සන්නිවේදනය

## හැඳින්වීම

යථාර්ථ ගවේෂණයේ අග්‍රඵලය වූ බුද්ධත්‍වයට පත්වීමෙන් අනතුරුව බුදුන්වහන්සේගේ සිතට නැගුණු ප්‍රශ්නයක් වූයේ ගැඹුරු ධර්ම කරුණු අවබෝධ කර ගැනීමට සාමාන්‍ය සමාජයට හැකිවේද යන්නය. (ඤාණානන්ද,2003,පි.228) එය එක් අතකින් ලෝකෝත්තර දහමක් ලෞකික භාෂාවකින් විග්‍රහ කිරීමේදී පැන නැගුණු ගැටලුවක් විය හැකිය. බුද්ධකාලීන සමාජයේ ප්‍රචලිත වී තිබුණු දෘෂ්ටිවාද අබිබවා බුදු දහම සමාජයේ සංස්ථාපනය කළ යුතු ආකාරයද එය කාලයත් සමඟ විපරීත නොවී පවත්වා ගැනීමද උන්වහන්සේට අභියෝගයක් වී තිබුණු බවට සැකයක් නැත. මහා ප්‍රඥාවෙන් යුතු මනා සන්නිවේදනඥයකු වශයෙන් බුදුන් වහන්සේ ඵිය ප්‍රචාරක මෙහෙයුම ජනතාව අතරට සාර්ථකව ගෙන ගිය බව වසර දෙදහස් හයසියයක් ගතවුවද නිර්මල බුදු සසුන ආරාක්ෂා වී තිබීමෙන් පැහැදිලි වෙයි.


නිවේදකයාගේ ග්‍රහණයට ග්‍රාහකයා පූර්ණ වශයෙන් හසු කර ගැනීමේ ක්‍රමෝපාය අනුගමනය කිරීම නිසා අනෙක් ආගම් අබිබවා ගොස් සමාජයේ මුල්බැස ගැනීමට බුදු දහමට හැකි විය. ඉතා ප්‍රබල සන්නිවේදනාර්ථයක් දනවන 'සරණාගමනය' යන වචනය පුද්ගලයාගේ සිතට කයට පමණක් නොව චර්යාවටද ප්‍රබලව බලපෑම් කිරීමට සමත් විය. දේශකයාණන් වහන්සේ සරණ යාම උන්වහන්සේගේ දහම් පණිවිඩය සරණ යාම, එය අනුගමනය කරන, ප්‍රචාරයේ යෙදෙන පිරිස සරණ යාම යන තුන්තරා සරණ යාම සිත, කය, වචනය යන අංගත්‍රයේ අනුකූලත්‍වයෙන් සිදු කිරීම බෞද්ධ සන්නිවේදනයේ සාර්ථකත්වයට බලපෑ මූලික හේතුව විය.

**බෞද්ධ සන්නිවේදනයේ විකාශනය**

බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ ආයතන සරණ යාමේදී පුද්ගලයා පසඟ පිහිටුවා වැඳ නමස්කාර කරන අතර මම බුදුන් වහන්සේද උන්වහන්සේගේ දහම සහ එම දහම පවත්වාගෙන යන ප්‍රචාරය කරන සංඝයා වහන්සේ සරණ යමි යන වැකිය වචනයෙන් ප්‍රකාශ කිරීම සිදුවේ. කිසියම් පණිවිඩයකට සිත කය වචනය යන තිදොරින් අනුකූලතාව දැක්වීම සාර්ථක සන්නිවේදනයකට බලපාන බව නූතන සන්නිවේදනඥයෝද පිළිගනිති. දිවුරුම් ප්‍රකාශන කියවීමේදී හස්ත මුද්‍රා දැක්වීම, හෝ සංඥා දැක්වීම මගින් පණිවිඩයට ග්‍රාහකයා ඒකාත්මික කිරීම නිවේදකයාගේ අභිප්‍රාය වී ඇති බව මෙයින් පෙනී යයි. තනි තනි වශයෙන් බහුජන හිත සුව පිණිස චාරිකාවේ යෙදී දහම් පණිවිඩය මිනිසුන් අතරට ගෙන යා යුතු බව බුදුන් වහන්සේ සිය ශ්‍රාවකයන්ට දෙසූහ. මෙම සන්නිවේදන ක්‍රියාවලිය තුළ නිවේදකයා පණිවිඩය සහ ග්‍රාහකයා යන කොටස් තුන සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු විධි බෞද්ධ සන්නිවේදන ක්‍රමයට ඇතුළත් වී ඇත.

නූතන ශාස්ත්‍රීය සන්නිවේදන දෘෂ්ටිය තුළ එම සංකල්ප විග්‍රහයට ලක් කිරීමෙන් පෙනී යන්නේ බුදුන් වහන්සේ ඉතා මැනවින් සිය දහම් කරුණු සමස්ත සමාජය වෙත සාර්ථකව සන්නිවේදනය කළ බවය. පුද්ගලයකුගේ චිත්තාභ්‍යන්තරයේ නැගෙන සමාන්තර හා විරුද්ධ සිතිවිලි තරංග ගැටීමෙන් ජනිත වන සිතිවිලි පරම්පරාව කෙනෙකු තුළ අභ්‍යන්තරව පැන නැගෙන සන්නිවේදනයක් ලෙස සලකන සන්නිවේදනඥයෝ **එය** අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය (Intra Personal Communication) වශයෙන් හඳුන්වා දෙති. පංචේන්ද්‍රියට ගෝචර වන අරමුණු ස්නායු ඔස්සේ මොළය කරා යැවෙන ආකාරයද මොළයෙන් නිකුත් වන නියෝග නැවත ස්නායු මණ්ඩලය ඔස්සේ පංචේන්ද්‍රියන් කරා ගමන් කරන ආකාරයද සලකා බලන කල අන්තර්වර්ති සන්නිවේදනය ද චක්‍රාකාරව සිදුවන බව දැක්විය හැකිය. ඇස, කන, දිව, නාසය ශරීරය යන ඉන්ද්‍රියන්ට ගෝචර වන අරමුණු චාලක ස්නායු ඔස්සේ මොළයට පණිවිඩ ගෙනයන අතර මොළයේදී භාෂාව උපයෝගී කොට ගෙන එයට අර්ථ ගන්වා නැවත චාලක ස්නායු ඔස්සේ ඉන්ද්‍රියන් වෙත ගෙනයාම සිදුවෙයි. යමක් දකින විට එය දිගටම රස විඳීමට හෝ එයින් ඉවත්වීමට ඇසට අණ ලැබෙන්නේ මොළය නමැති පාලක මධ්‍යස්ථානයෙනි. පුද්ගලාන්තර සන්නිවේදනයේදී මෙන් චක්‍රාකාරව සිදුවන මෙම ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම පහසුය. එහෙත් මනෝන්ද්‍රිය තුළම ජනිත වී වැඩී අනෙකුත් විරුද්ධ සිතිවිලි සමඟ ගැටී බිඳී නැවත ජනිත වී යන සිතිවිලි පරම්පරාවක්ද ඇති අතර ඒවාද භාෂාව උපයෝගී කරගෙන අභ්‍යන්තර සංවාදයක් ලෙස පවතී. බුදුන් වහන්සේ පංචේන්ද්‍රිය සහ මනෝන්ද්‍රිය උපයෝගි වීමෙන් දහඅට ආකාරයක සිතිවිලි සමුදායක් ගොඩ නැගෙන ආකාරය ඉතා මැනවින් මජ්ජිම නිකායේ ධාතුවිභංග සූත්‍රයෙන් පෙන්වා දී ඇත (ලංකානන්ද හිමි,1974,පි497-512)

හැඟීම් අවදි වූ පුද්ගලයන්ගේ අභ්‍යන්තර භාෂණය බාහිරව පෙනෙන අවස්ථා ඇතැම් විට දකිය හැකිය. පංචේන්ද්‍රියන්ගේ පිහිටක් නොමැතිව සිත තුළ ඇතිවන මෙම සිතිවිලි චක්‍රයක් මෙන් නැවත නැවත ඇතිවෙයි. හැඟීම්, තර්ක, විතර්ක, රුචි අරුචිකම්, අනුස්මරණ ආදී වශයෙන් මෙම පණිවිඩ මොළයට ලැබෙන අතර එමඟින් ඉහත කී සිතිවිලි නැවත නැවත නිර්මාණය වෙයි. මේ අනුව අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ ස්වභාවය තීරණය කිරීමට බලපාන සාධක කිහිපයක් වශයෙන් හැඟීම්, රුචිකත්ව, තර්ක, අත්දැකීම්, ස්මරණ ආදිය හඳුනා ගත හැකිය.




ඉහත කී සාධකවල ස්වභාවය තීරණය කිරීමට පුද්ගලයාගේ භූමිකාව මෙන්ම ආවේනික මනෝගති (attitudes) පෞද්ගලිකත්වය නැතහොත් ස්වීයත්වය (personalty) ස්වයං සංකල්පය (self-concept) යන ලක්ෂණ බලපාන බවද සන්නිවේදනඥයෝ පෙන්වා දෙති(Gamble,1987,p30). කෙසේ හෝ අවසාන වශයෙන් පුද්ගලයා තුළ ඇතිවන මනෝසවභායන් ඔහුගේ චර්යාවන් ඔස්සේ බාහිර ලෝකයට ප්‍රදර්ශනය වෙයි. බාහිර්වර්තිකයන් ලෙස හඳුනාගත හැකි විවෘත පුද්ගලයන්ද අන්තර්වර්තිකයන් ලෙස හඳුනාගත හැකි ගුප්ත පුද්ගලයන්ද බිහිවන්නේ මේ අනුවය. (කරුණානායක,1994,පි.9.) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයෙහි ස්වභාවයට බලපෑම් කරන සාධක වශයෙන් සන්නිවේදන විද්වතුන් හඳුනාගෙන ඇති පුද්ගලයාගේ සමාජ භූමිකාව, මනෝගති පෞරුෂත්වය ආදී බාහිර හා අභ්‍යන්තර සාධක ඉතා සරල ලෙස සූත්‍ර පිටකයට ඇතුළත් සංයුත්ත නිකායේ කෝසල සංයුක්තයේ එන ප්‍රිය සූත්‍රයේදී ඉදිරිපත් කර ඇත. (ඤාණානන්ද හිමි,2003,පි.163-164.)

“පින්වත් මහරජ සමහර උදවිය ඉන්නවා ඒ අය කයින් වැරදි කරනවා, වචනයෙන් වැරදි කරනවා සිතෙන් වැරදි කරනවා ඇත්තෙන්ම ඒ අයට තමන්ව තමන්ට ප්‍රිය නෑ ඔවුන් කතාවට විතරක් තමන්ට තමන් ප්‍රිය බව කියනවා. මහරජ, කෙනෙක් තමන් අප්‍රිය කෙනෙකුට යමක් කරනවද ඒකම තමයි ඒ අය තම තමන්ට කර ගන්නෙ ඒ නිසාම ඔවුන්ට තමන්ව ප්‍රිය නෑ.

ඒ වගේම මහරජ සමහර උදවිය ඉන්නවා කයින් යහපත් දේ කරනවා වචනයෙන් යහපත් දේ කරනවා සිතින් යහපත් දේ කරනවා ඒ අයට තමන්ට තමන් ප්‍රිය යි.''

බුදුන් වහන්සේ විසින් ප්‍රිය සූත්‍රයේදී වදාළ "ස්වකීය ප්‍රියභාවය" සහ "ස්වකීය අප්‍රියභාවය" යන සංකල්පය තුළ පුද්ගල ස්වයං සංකල්පයේ සමස්ත ස්වභාවය කොටස් දෙකකට බෙදා දක්වා ඇත. ඒ අනුව පුද්ගලයාගේ අන්තර්වර්ති සන්නිවේදනය හැඩ ගැසෙන ආකාරය පැහැදිලි කර ඇත. ස්වකීය ප්‍රියබව ඇති පුද්ගලයාගේ අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය යහපත් අතට සිදුවන අතර ඒ අනුව ඔහුගේ චර්යාවන් හා පුද්ගලාන්තර සන්නිවේදනය යහපත්ව සිදුවෙයි.

ස්වකීය අප්‍රියභාවය ඇති පුද්ගලයා, අප්‍රිය කෙනෙකු කෙරේ අනුගමනය කරන ක්‍රියාවලිය තමාටම සිදු කර ගනී. එනම් අභ්‍යන්තර භාෂණ අහිතකර ලෙසද ඒ අනුව වචනය නොහොත් අන්තර් පුද්ගල සන්නිවේදනයද ඔහුගේ සමස්ත චර්යාවද තමාට මෙන්ම සමාජයාටද අහිතකර ලෙස සකස්කර ගනී. නූතන සන්නිවේදනඥයින් අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ ස්වභාවය පිළිබඳ ඉදිරිපත් කරන පුද්ගල මනෝ-භෞතික සංකල්ප රාශියක් බුදුන් වහන්සේ ස්වකීය ප්‍රියභාවය සහ ස්වකීය අප්‍රියභාවය යන සංකල්පය තුළ සරලව පැහැදිලි කර ඇත. අප විසින් අප දකින ආකාරය, සන්නිවේදන කාර්යට සෘජුව බලපාන බව සන්නිවේදකයෝ පෙන්වා දී ඇත. අප විසින් අප දැකිය යුතු ආකාරය බුදුරජානන් වහන්සේ අනුමාන සූත්‍රයේ දී ඉතා මැනවින් පෙන්වා දී ඇත. තමන් ක්‍රෝධ සහිත පුද්ගලයෙක්ද, කපටි පුද්ගලයෙක්ද නැතහොත් කිසියම් මත වාදයක එල්බ ගත් අයෙක්ද යන්න විමර්ශනය කළ යුතු ආකාරය විස්තරාත්මකව පෙන්වා දී ඇත (ඤාණානන්ද හිමි,2003,,පි,212).

අනතර්වර්තී සන්නිවේදනයේ ස්වරූපය කුමක් වුවද එය ඊළඟ අදියරේදී පුද්ගලාන්තර සන්නිවේදනයට මඟ පාදයි. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය පුද්ගලාන්තර සන්නිවේදනය දක්වා ගමන් කිරීමේදී අතරතුර බාධකයක් වශයෙන් 'ග්‍රාහක මානය' නැමැති මනෝභාවය ක්‍රියාත්මක වන ආකාරය සංයුත්ත නිකායේ උපාසක වර්ගයේ එන මානත්ථද්ධ සූත්‍රයෙන් පැහැදිලි කර ඇත (එම පි. 359-361).

**නූතන සන්නිවේදනය සඳහා ජාතක කතාවස්තුවේ පිටුවහල**

අධික මානයෙන් යුතු වූ මානත්ථද්ධ බමුණා ගුරු දෙගුරු වැඩිහිටි සහෝදර කිසිවෙකුට ගරු නොකළේය. කිසිවකු සමඟ පළමුව කතා නොකළේය. වරක් බුදුරජානන් වහන්සේගෙන් දහම් ඇසීමට ගිය ඔහු සිතාගෙන ගියේ උන් වහන්සේ තමාට පළමුව කතා නොකොළ හොත් තමුන් කතා නොකරන බවය. ධර්ම සභාවේ සිටි ඔහුට බුදුන් වහන්සේ කතා නොකළ බැවින් ආපසු යන්නට සූදානම් විය. ඔහුගේ සිත දැනගත් බුදුන් වහන්සේ බමුණා නැවත කැඳවා මෙසේ දේශනා කළහ

.

"පින්වත් බ්‍රාහ්මණය කිසියම් ප්‍රයෝජනයක් බලාගෙන මෙතනට ආ අයකු මාන්නය වැඩිකර ගන්න හොඳ නැහැ. ප්‍රයෝජනයක් ගැනීමට ආවා නම් එය ඉටුකරගැනීමයි කළ යුත්තේ."


බුදුන් වහන්සේ තමාගේ සිතිවිලි දැනගත් බව අවබෝධ කරගත් මානත්ථද්ධ බුදුන් වහන්සේගේ පාමුල වැඳ වැටී තමා මානත්ථද්ධ බැව් පිරිසට ඇසෙන සේ හඬ ගා කීවේ

තමාගේ මානය නැතිකර ගත් බව ප්‍රකාශ කරන අයුරිනි. මානය පුද්ගලාන්තර සන්නිවේදන බාධකයක් බවද එමගින් සන්නිවේදනය ඇහිරී පුද්ගලයාට පාඩු සිදුවිය හැකි බවද මානත්ථද්ධ සූත්‍රය අනුව පැහැදිලි වෙයි.

සමාජ ස්ථරායණය (Stratification) යන සංකල්පය තුළ සමාජ විද්‍යාඥයන් විග්‍රහ කරන්නේ කුමන හෝ පදනමක් මත සමාජය ස්තර වශයෙන් බෙදී පැවතීමය. ජාති ආගම් කුල වශයෙන් හෝ ධන විසමතාව මත මෙම බෙදීම් සිදුවිය හැකිය. එමෙන්ම උගත් කම, නූගත් කම, නිලය, බලය යනාදී විවිධ වූ හේතු සාධක මත හෝ වෙනත් කිසියම් මනෝ-භෞතික සාධක මත සමාජය විශාල ස්තර වශයෙන් හෝ කුඩා කණ්ඩායම් වශයෙන් බෙදී යාමට ඉඩ ඇත.

විවිධ වූ කණ්ඩායම් පවතින සමාජයක පුද්ගලාන්තර සන්නිවේදනය ඉතා මැනවින් පැවතීම ගැටුම් නිවාරණය සඳහා අත්‍යවශ්‍ය වෙයි. බොහෝ ගැටුම්වලට මුල් වන සන්නිවේදන දුර්වලතා (Lack of Communication) මානය නමැති මනෝගතිය මත බිහිවන බව මෙම දේශනාව තුළ අධ්‍යාහාර වෙයි. මානය නැමැති බාධකය දුරලීම මනා සන්නිවේදනයේ පූර්ව අවශ්‍යතාවක් බව ඉහත කී සූත්‍රයෙන් අවධාරණය වෙයි.

අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ ඊළඟ පියවර වශයෙන් ඇරඹෙන පුද්ගලාන්තර සන්නිවේදනය සන්නිවේදන විද්වතුන්ගේ පුළුල් නිරීක්ෂණයට භාජන වූවකි. විල්බර් ශ්‍රාම් පෙන්වා දෙන්නේ පුද්ගලාන්තර සන්නිවේදනය මනාව සිදුවීමට නම් නිවේදක ග්‍රාහක පොදු අත්දැකීම් ක්ෂෙත්‍රය පුළුල් විය යුතු බවය. පොදු අත්දැකීම් ක්ෂෙත්‍රය කුඩා වන ප්‍රමාණයට සන්නිවේදන බාධක පැන නගින බවත් දෙදෙනාගේ අත්දැකීම් ක්ෂෙත්‍රය වෙන්ව පවතින්නේ නම් සන්නිවේදනය සිදු නොවන බවත් ඔහු පෙන්වා දුන්නේය.




ආකෘතියේ සඳහන් පොදු අත්දැකීම් වෘත්තය විශාල වන්නේ නම් නිවේදක-ග්‍රාහක අත්දැකීම් බොහෝදුරට සමාන වන බව විල්බර් ශ්‍රාම් පෙන්වා දී ඇත (Andal,1998,p.154). පොදු අත්දැකීම් ක්ෂෙත්‍රය කුඩා වුවද උපායශීලි සන්නිවේදකයකුට ග්‍රාහකයාගේ අත්දැකීම් ක්ෂෙත්‍රයෙන් කොටසක් සිය ග්‍රහණයට ගෙන ඔහුට පණිවිඩයක් සම්ප්‍රේෂණය කළ හැකිය. බුදුරජානන් වහන්සේ එසේ කළ බව කසීභාරද්වාජ සූත්‍රයෙන් මනාව පැහැදිලි වේ

(ඤාණානන්ද හිමි,පි.349) විශාල වශයෙන් වී ගොවිතැනෙහි යෙදෙන කසීභාරද්වාජ බමුණා සී සා කුඹුරු වැපිරීමෙහි නිරත වී සිටියේය. දහවල් ඇඹුල බෙදන අතරතුර බුදුන් වහන්සේ එම ස්ථානයට පිඬු සිඟා වැඩියහ. බමුණා බුදුන් වහන්සේට ප්‍රකාශ කළේ තමා මහන්සියෙන් සී සා වපුරා අනුභව කරන බවය. එසේ කරන ලෙස ඔහු බුදුන් වහන්සේගෙන්ද ඉල්ලා සිටියේය. තමන්ද සී සා වපුරා අස්වැන්න නෙළාගෙන අනුභව කරන බව උන් වහන්සේද බමුණාට පැවසූහ. ඒ පිළිබඳ වැඩි දුරටත් කරුණු දැන ගැනීමේ කුතුහලයෙන් පසුවූ බමුණාට උන්වහන්සේ සිය ගොවිතැන ගැන පියවරෙන් පියවර විස්තර කළහ.

"පින්වත් බමුණ මගේ බිත්තර වී කියන්නෙ ශ්‍රද්ධාවටයි. තපස තමයි වැස්ස, නගුල සහ වියගස ප්‍රඥාවයි. නගුල් හිස වෙන්නෙ ලැජ්ජාවයි. යොත විදියට තියන්නෙ මනසයි. මගේ හී වැලත් කෙවිටත් කියලා කියන්නෙ සිහියටයි. මම සී සෑවෙ ඔන්න ඔය විදියටයි. මට අස්වැන්න හැටියට ලැබුනෙ අමා මහ නිවනයි."

නූතන සන්නිවේදනඥයන් විසින් සඳහන් කරනු ලබන ග්‍රාහකයාගේ මනෝ-භෞතික ස්වභාවය ස්පර්ශ කිරීමට නිවේදකයකු වශයෙන් බුදුන් වහන්සේ කටයුතු කර ඇති ආකාරය කසී භාරද්වාජ සූත්‍රයෙන් පෙනේ. බමුණා පුහුදුන් ගොවියකු වූ අතර බුදුන් වහන්සේ මහා දාර්ශනිකයෙක් වූහ. මොහොතකට ගොවියකු බව ඇඟ වූ උන්වහන්සේ භාරද්වාජ බමුණාට සමාන වූහ. බමුණාගේ වෘත්තිය ඇසුරෙන්ම ඔහුට හුරු ගොවි උපකරණ ඇසුරෙන්ම ගැඹුරු ධර්ම කරුණු දේශනා කළහ. අවසානයේ ගොවි බමුණා සිය උත්සාහයෙන් සශ්‍ය සම්පත් ලබන අතර බුදුන් වහන්සේ සිය උත්සාහයෙන් නිවන් සම්පත් ලබන බව පැහැදිලි කළහ. ග්‍රාහකයාගේ මනෝ-භෞතික පරිසරයෙන් පටන් ගෙන ඔහු ක්‍රමයෙන් ගැඹුරු පණිවිඩයක් අවබෝධ කරලීම සඳහා උපක්‍රමශීලිව මෙහෙය වීම පූර්වෝක්ත දේශනයේදී සිදුවී ඇත. එසේම පන්සියපණස් ජාතක පොතේ එන මාංස ජාතකයේ ධාරණාව සලකා බලන කල එලදායි සන්නිවේදනය උදෙසා ග්‍රාහකයා අවබෝධ කර ගැනීමේ වැදගත්කම ඉතා මැනවින් පැහැදිලි වෙයි. මාංස ජාතකයේ අතීත කතාවේ සිදුවීම් පෙළ මෙසේය (කුලසූරිය,2000, පි195-196).

"යටගිය දවස බරණැස බ්‍රහ්මදත්ත රජ සමයේ බෝසතාණෝ සිටු පුත්‍රයකුව ඉපිද සිටියහ. හෙතෙම දිනක් මිතුරු සිටු පුතුන් තිදෙනෙකු හා එකතුව මඟ අයිනේ රැඳී සතුටු සාමිචි කතා බහේ යෙදී සිටියේය. මේ අතර එක්තරා මස් වැද්දෙක් ගැලක් පුරා මුව මස් තබාගෙන වෙළඳාම් පිණිස නගරයට ගියේය. ඔවුන් පසුකර යන වැද්දා දුටු එක් සිටු තරුණයෙක් මුව මස් ටිකක් ඉල්ලා ගැනීමට වැද්දා කරා ගියේය."

'කොල වැද්ද මට මස් කඩක් දෙව'යි ඔහු වැද්දා ඇමතීය.

ඔහුගේ දැඩි ඇමතීම නිසාම වැද්දාගෙන් ඔහුට ලැබුනේ දැඩි වූ අහරට නුසුදුසු වූ මස් කැබැල්ලකි. මෙම අත්දැකීම ගුරු කොට ගත් දෙවැනි සිටු තරුණයාද වැද්දා වෙත ගියේ මස් කැබැල්ලක් ඉල්ලා ගනු පිණිසය.

"බෑණනි (සහෝදරය) මටද එක් මස් කඩක් දුන මැනවි"

යනුවෙන් ඔහු වැද්දාගෙන් මස් ඉල්ලුවේය. වැද්දාට ප්‍රිය වචනයෙන් ඇමතූ ඔහුට වඩා හොඳ මස් කැබැල්ලක් ලබා ගැනීමට හැකි විය. දෙවැන්නාගේ ඇමතීම වඩාත් සාර්ථක වූ බව දුටු අනෙක් සිටු කුමරාද වැද්දා කරා එළඹ මස් ටිකක් ඉල්ලුවේය.

'පියාණෙනි මට මස් කඩක් දෙව'යි ඔහුගේ ආයාචනය විය.


වැද්දාගෙන් ඔහුට හෘද මාංසය බඳු මිහිරි මස් ටිකක් ලැබුනේය. අවසානයේ බෝසත් සිටු කුමරා වැද්දා වෙත ගියේය.

'මිත්‍රය මටද මස් කඩක් දෙව'යි හෙතෙම කීවේය. මිත්‍ර වදනින් තමන් ඇමතූ සිටු කුමරාට ඔහු මස් ගැල පිටින්ම දුන්නේය. ජාතක කතාවේ එන පරිදි වැද්දා කටයුතු කළේ තමාට ලැබුණු සියලු ඇමතුම් ඉතා මැනවින් විමසුමට ලක් කිරීමෙන් අනතුරුවය. නිවේදකයා ග්‍රාහකයාගේ සිතුම් පැතුම් පිළිබඳ මනා අවබෝධයකින් යුතුව පණිවිඩයක් සැලසුම් කිරීමෙන් මහඟු ප්‍රතිඵල ලබා ගැනීමට හැකි බව මාංස ජාතකයෙන් මනාව පෙන්වා දී ඇත. ඒ අනුව තත්කාලීන සමාජයේ පුද්ගලාන්තර සන්නිවේදනයේ විවධ තල පිළිබඳ අවබෝධයක් ලැබිය හැකිය.

| ඇමතීමේ ස්භාවය | ප්‍රතිචාරයේ ස්වභාවය | ප්‍රතිඵලය |
|---|---|---|
| කොල වැද්ද! | අසතුටුදායකයි | 25% |
| බෑණනි!(සහෝදරයා) | සතුටුදායකයි | 50% |
| පියාණෙනි! | විශිෂ්ටයි | 75% |
| මිත්‍රය! | අතිවිශිෂ්ටයි | 100% |

නූතන ජනසන්නිවේදන මාධ්‍යවේදියකු කෙනෙකු හා සම්මුඛ සාකච්ඡාවක් කිරීමේදී එයට බඳුන් වන තැනැත්තාගේ සියලු තොරතුරු රැස්කර ගැනීම එම මාධ්‍යවේදියා විසින් කළයුතු බව අවධාරණය කර ඇත්තේ මෙනිසාය. (Harcup,2004,p,96) නිවේදකයා ග්‍රාහකයාට සමීප වූ තරමට සම්මුඛ සාකච්ඡාව සාර්ථක වන බව පිළිගැනේ.

රූප සටහන 01: ග්‍රාහකයා කෙරේ නිවේදකයා හැසිරිය යුතු ආකාරය




මූලාශ්‍රය:Andal,1998

රූප සටහන 01 හි සදහන් ආකෘතියේ ග්‍රාහක-නිවේදක, මනෝ-භෞතික ස්වභාවයන් වන සන්නිවේදන කුසලතා , මනෝගති, දැනීම, සමාජ ක්‍රමය, සංස්කෘතිය යනාදිය පිළිබඳ සැලකිලිමත් වීම සන්නිවේදකයා විසින් කළයුතු බව පෙන්වන නිදසුනක් වශයෙන් මජ්ජිම නිකායේ එන සච්චවිභංග සූත්‍රයේදී බුදුන් වහන්සේ විසින් පෙන්වා දෙනු ලැබ ඇත (සිරිසුමන,2011,පි.47) දේශකයානන් වහන්සේ භාෂාව භාවිතයේදි සැලකිලිමත් විය යුතු බවත් දේශනා ශෛලිය කෙසේ **සකස්** කරගත යුතුද යන්නත් මනාව පැහැදිලි කර ඇත.
ජනපද නිරුක්තිය හෙවත් ප්‍රාදේශීය **බස්** වහර ස්ථාවරව භාවිත නොකර පොදුජන වහර දේශනා සඳහා යොදා ගත යුතු බව නිදසුන් සහිතව පෙන්වා දී ඇත. එක් එක් ජනපදවල එකම බඳුන සඳහා විවිධ වචන භාවිත වන ආකාරය පෙන්වා දී එයින් එක වචනයක දැඩිව නොපිහිටන ලෙස දේශකයනට අවවාද දී ඇත. එසේ වුවද දේශකයා ඒ පිළිබඳ අවබෝධයෙන් පසු විය යුතු බව උන්වහන්සේ පෙන්වා දී ඇත. තවද කථකයාගේ කතා ශෛලිය පිළිබඳව මජ්ජිමනිකායේ උපරිපණ්ණසකයහිදී පෙන්වා දී ඇත. (බුද්ධශාසන අමාත්‍යංශය, 1996,පි.304).

"කලබලයෙන් කථා කරණුයේ කයද වෙහෙසී සිතද පෙළෙයි. කටහඬ බිඳී යයි. උගුරද ලෙඩ වෙයි. කලබලයෙන් කියන ලද්ද නොපැහැදිලිය. තේරුම් ගත නොහැකිය. කලබල නොවී කථා කරනුයේ කයද නොවෙහෙසයි. සිතද නොපෙළයි. කටහඬ නොබිඳෙයි. උගුර ලෙඩ නොවෙයි. සන්සුන්ව කියන ලද්ද පැහැදිලිය තේරුම් ගත හැකිය".
විනය පිටකයෙහි ධර්මදේශනා සඳහා අනුගමනය කළයුතු විනය නීති කිහිපයක් දක්නට ඇත. ඒ අනුව දහම් නොදෙසිය යුතු පුද්ගලයන් මෙසේය (බෞද්ධ විනය අධ්‍යයනය පි.210)

- ඡත්‍ර දඬු, කඩු, ආයුධ දරන්නවුන්
- මිරිවැඩි පයලා සිටින්නවුන්
- රථයක නැඟී සිටින්නවුන්
- බිම වැතිර සිටින්නවුන්
- අත් (බැඳගෙන) පා නිදහසේ නොතබා වක්කොට හෝ හරස් කොට සිටින්නවුන්
- ජටා බැඳ සිටින්නවුන්
- දේශකයා බිම සිටින විට අසුන්වල සිටින්නවුන්
- දේශකයා මිටි අසුනක සිටින විට උස් අසුන්වල සිටින්නවුන්
- දේශකයාට ඉදිරියෙන් ගමන් කරන්නවුන්
- පාරෙන් ඉවත සිට පාරේ ගමන් කරන්නවුන්

යන පිරිස්වලට දහම් නොදෙසිය යුතු බව විනය නීතිවල සඳහන් වේ. ග්‍රාහකයා ගේ මනෝ-භෞතික තත්ත්වය පිළිබඳව ඉතා මැනවින් සලකා බලා මෙම නීති පද්ධතිය සකසා ඇති බව පෙනේ. තත්කාලීන සමාජයේ නිලබල ක්‍රමයක සංකේත වූ ඡත්‍රය, දණ්ඩ, කඩුව, ආයුධය දරන අය නිල මානයෙන් හෝ බල මානයෙන් යුතු තැනැත්තන් වීමට ඉඩ ඇත. විවේක බුද්ධිය හෝ විමංසන බුද්ධිය නොමැති ඔවුනට අවබෝධ වන පරිදි දහම් දෙසීමට නොහැකිය. මෙම සියලු පිරිස සලකා බලන කල ඔවුන් දේශකයා කෙරේ නිසි ගෞරවයක් නොදක්වන ඉරියව්වලින් යුතු බව පෙනී යයි. එසේම ඔවුන් පණිවුඩය ග්‍රහණය කර ගැනීමේ පූර්ව සූදානමකින් යුක්ත පිරිසක් නොවන බවද හැඟී යයි. එනිසාම ඔවුනට දේශනා කිරීම නිරර්තක කරුණක් බවට පිළිගෙන තිබීම මෙම විනය නීති අනුව පැහැදිලි වෙයි. නූතන සන්නිවේදනඥයින් ආංගික භාෂාව පිළිබඳ සැලකිල්ලක් දක්වන්නේ එමගින් ග්‍රාහකයාගේ සිත කියවීමට අනුබලයක් ලැබෙන බැවිණි. (Pease,1993,p.59)
එහෙත් ඉහත කී සියලු ඉරියව්වලින් යුත් ගිලන් වූ අයට දහම් දෙසීමේ තහනමක් නොමැත්තේ භෞතික පරිසරයෙන් බලපෑමක් ග්‍රාහකයාගේ මනසට නොලැබෙන බැවිනි. මෙයින් පෙනී යන්නේ පුද්ගලාන්තර සන්නිවේදනයේදී ග්‍රාහකයාගේ තත්ත්වය පිළිබඳ සුපරීක්ෂාකාරී වීම නිවේදකයා විසින් කළ යුතු බවය. ග්‍රාහක මනෝ-භෞතික පරිසරය නිවේදකයාගේ පණිවිඩය පිළිගැනීමට යෝග්‍ය පරිදි තිබිය යුතු බව තත් උපදේශනය අනුව පැහැදිලි වෙයි. පුද්ගලාන්තර සන්නිවේදනයේදී අවම වශයෙන් භෞතික පරිසරය අනුව හෝ නිවේදකයා හා ග්‍රාහකයා සමාන මට්ටමක සිටිය යුතු බව මේ අනුව පිළිගත යුතු වෙයි.

නිවේදකයා විසින් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ගය මෙන්ම පණිවිඩයේ දාරණාව එය ප්‍රකාශ කළයුතු පරිසරය යනාදී කරුණුද ත්‍රිපිටකයේ අඩංගුව පවතී (බුද්ධ ශාසන අමාත්‍යංශය,1996-පි.306). ඒවා පහත සඳහන් පරිදි වේ.

- නොසිදු වූ දෙයක් ගැන කිසියම් අපවාදාත්මක. අසත්‍ය, අවැඩදායක දේ නොකියා සිටීමට උත්සාහ ගත යුතුය,
- යම් සත්‍යයක් අපවාදාත්මක, අවැඩදායක දෙයක් නම් නොකියා සිටීමට උත්සාහ දැරිය යුතුය
- යම් සත්‍යයක් අපවාදාත්මක, වැඩදායක දෙයක් වන විට එය සුදුසු කාලයේදී කිය යුතුය
- නොසිදු වූ අසත්‍ය. කුපිතකරවනසුලු, අවැඩදායක දේ නොකියා සිටීමට උත්සාහ ගත යුතුය,

- සිදු වූ සත්‍යයක කුපිතකරවනසුලු අවැඩදායක දේ නොකියා සිටීමට උත්සාහ දැරිය යුතුය.
- සත්‍ය වැඩදායක කුපිත කරවනසුලු කතා සුදුසු කාලයේදී කිය යුතුය.

(ධම්මානන්ද, 1979,පි.368) බුදුන් වහන්සේ විසින් වසර දෙදහස් හයසියයකට තරම් ඉහතදී පෙන්වා දුන් සන්නිවේදන නීති රීති නූතන ජනමාධ්‍ය ආචාර ධර්ම හා නීති රීතිවලට සමීප බවක් පෙන්වන අතර ඒවා සාර්වත්‍රිකව ජනතාවට හිතකර අයුරින් සකස් කර ඇති බව පෙනේ. සත්‍ය වූද සමාජයට හිතකරවූද ග්‍රාහකයාට ප්‍රිය වූද ප්‍රවෘත්ති සුදුසු කාලයේ සුදුසු අවස්ථාවක ප්‍රකාශ කිරීම ඉහත කී සන්නිවේදන රීතිවලින් අනුමත කර ඇත.
නිවේදකයාගේ කාර්ය පිළිබඳව කරුණු පෙන්වා දෙන අතරම ග්‍රාහකයා විසින් අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටියක්ද බුදුන් වහන්සේ විසින් අනුදැන වදාරා ඇත. වැරදි නිවේදකයකුගේ වැරදි පණිවිඩයක් මඟ හරින ආකාරය මජ්ඣිම නිකායේ කකචූපම සූත්‍රයේදී පෙන්වා දී ඇත. නිවේදකයාගේ පණිවිඩය පංචාකාර බව මෙම සූත්‍රයෙන් දේශිතය.

- සුදුසු හා නුසුදුසු අවස්ථාවලදී කෙනෙකුගේ පණිවිඩයකට සවන් දීමට ඔබට සිදුවිය හැකිය.
- සත්‍යයක් හෝ අසත්‍යයක් වශයෙන් කෙනෙකුගෙන් ඔබට පණිවිඩයක් ලැබීමට හැකිය.
- මෘදු ලෙසින්ද නැතහොත් නපුරු ලෙසින්ද කෙනෙකුගෙන් ඇමතීමක් ඔබට ලැබෙන්නට හැකිය.
- තමන්ගේ යහපත පිණිස හෝ අයහපත පිණිස හෝ අන් කෙනෙකු යමක් පැවසිය හැකිය.
- කෙනෙක් මෛත්‍රී සිතින් හෝ ද්වේශ සිතින් හෝ ඔබට යමක් පැවසිය හැකිය.

අහිතකර පණිවිඩයක් තමන් කරා එන විට එයට මනස වසන ආකාරය බුදුන් වහන්සේ පෙන්වා දී ඇත. එයට ප්‍රතිචාර වශයෙන් නපුරු වචන පිට කිරීම නොකළ යුතු අතර ද්වේශයෙන් තොරව අනුකම්පාවෙන් මෛත්‍රියෙන් යුතුව නිශ්ශබ්ද වීමෙන් අහිතකර පණිවිඩයක් මඟ හැරිය හැකි බව උන්වහන්සේ පෙන්වා දෙති. යථාවබෝධයෙන් යුතුව පණිවිඩය දෙස බලන කල එහි අන්තර්ගතය පිළිබඳ වටහා ගැනීම අපහසු නොවේ.
ආකෘතියේ හෝ අන්තර්ගතයේ විලාසය කුමක් වුවද මෙම පංච විධ ආකාරයෙන් එකක් හෝ කිහිපයක් සහිත පණිවිඩයක් ග්‍රාහකයාට ලැබිය හැකිය. 'කියන්නා කුමක් කීවද අසන්නා සිහි බුද්ධියෙන් ඇසිය යුතුය' යන කියමන ඉහත කී උපදේශය තුළ විග්‍රහ කර දක්වා ඇත. විරෝධාකල්ප ප්‍රකාශනය, අපහාසය උපහාසය දැනවීම, ජනමතය ඇති කිරීම ආදිය කෙරේ අවස්ථානුකූලව ක්‍රියා කිරීමට සන්නිවේදකයාට අවසර ඇතැයි යන්න ඇඟවෙන සිද්ධියක් සංයුත්ත නිකායේ බ්‍රාහ්මණ සංයුත්තයේ එන මහාසාල සූත්‍රයේ දක්නට ඇත.

බුදුන් වහන්සේ සැවැත්නුවර ජේතවන අසපුවේ වැඩවසන සමයේ එක්තරා බ්‍රාහ්මණ ප්‍රභුවරයෙක් වියපත් වූ කල සිය දරුවන්ගේ සැලකිලි නොලබා අසරණව ගියේය. හෙතෙම බුදුන් වහන්සේ හමුවට පැමිණියේ වැරැහැලි වූ වස්ත්‍ර සහිතවය. බුදුන් වහන්සේ ඔහුගෙන් තොරතුරු විමසූහ. සිය තරුණ පුතුන් හතර දෙනා බිරින්දෑවරුන්ගේ බසට නැමී තමා ගෙදරින් පිටමන් කළ බව බමුණා පැවසුවේය.

බමුණාගේ පුතුන් සමාජයේ ප්‍රභූත්වයක් දරණ පිරිසක් බව අවබෝධ කරගත් බුදුන් වහන්සේ කරුණාව මුසු උපදේශනය වෙනුවට විකල්ප සන්නිවේදන මාර්ගයක් අනුගමනය කළහ. උන්වහන්සේ බමුණාට ගාථාවක් කියා දී එය කට පාඩම් කරගෙන බමුණාගේ ප්‍රභූ පුතුන් සිටින සභාවලදී උස් හඬින් ගායනා කරන ලෙසට උපදෙස් දුන්හ. එහි සමුච්චයාර්ථය මෙසේ.

"මට දාව උපන් පිරිමි දරුවන් හතර දෙනෙක් ඉන්නවා. මම ඔවුන්ගේ දියුණුව ප්‍රාර්ථනා කළා. ඔවුන්ගේ දියුණුව ගැන සතුටු වුණා. අන්තිමේදී ඔවුන් බිරින්දෑවරුන් සමඟ එක්වෙලා මාව එළවා ගත්තේ බලු රැලක් ඌරකු එන මග අවුරනවා වගෙ, මට තාත්තා කීව ඔවුන් රාස්සයෝ, අසත්පුරුෂයෝ මම දූන් වැඩක් ගන්න බැරි මහලු අශ්වයෙක් වගෙ, ඔවුන් මාව එළවනවා, දූන් මම අනුන්ගේ ගෙවල්වලින් හිඟා කනවා, මගේ අකීකරු පුතාලට වැඩිය මේ හැරමිටිය මට හුඟක් වටිනවා. මේ හැරමිටියට පුළුවන් නපුරු ගොනෙක් එළවන්න, නපුරු බල්ලෙක් එළවන්න, මං කළුවරේ යන විට හැරමිටිය ඉස්සර වෙනවා පය පැකිලී වැටෙන්නට යන විට හැරමිටියේ අනානුභාවයෙනුයි මං කෙළිං හිටින්නෙ."

මහලු බමුණා බුදුන් වහන්සේ කියා දුන් ගාථාව සිය ප්‍රභූ පුතුන් සහිත මහජන සභාවලදී ගායනා කළේය. අවසානයේ දී පුත්තු හතර දෙනා පියා ගෙදර කැඳවාගෙන ගොස් නහවා, කවා පොවා, වස්ත්‍ර සම්පාදනය කර දී රැක බලා ගත්හ.

එකල පැවති පොදු සමාජ ප්‍රශ්නයක් පිළිබඳව නිර්මාණාත්මක සන්නිවේදන උපක්‍රමයකින් මහජනතාව දැනුවත් කිරීම මෙමඟින් සිදු වී ඇත. එසේම ප්‍රභූවරුන් වූ බමුණු පුතුන්ට ඍජු අපහාසයක් නොවන පරිදි බමුණාගේ ගාථා ගායනය සිදුවන අතර එමඟින් ඉදිරියේ දී සිදුවිය හැකි කීර්ති හානියක් පිළිබඳව අනතුරු හැඟවීමක්ද කෙරේ. ඇතැම්විට සිය පියාගේ දුක් ගායනය සාවධානව අසා සිටීමට අවස්ථාවක් නොලද පුතුන්ට එයට කන් දී යථාවබෝධය ලබා ගැනීමටද එමඟින් හැකි වී ඇත. එය සමකාලීන සමාජ ප්‍රශ්නයක් නම් ඒ පිළිබඳ ජනතාව දැනුවත් කර ජනමතයක් ඇති කරලීමට වුවද පූර්වෝක්ත ප්‍රචාරය ඉවහල් වන්නට ඇත.

සන්නිවේදනය සහ භාෂාව පුද්ගලයාගේ හෝ සමස්ත සමාජයේ ප්‍රයෝජනයට යොදාගත හැකි මෙවලමක් විනා එය අවැඩදායක අනවශ්‍ය වාද විවාද කිරීමට යොදා නොගත යුතු බව සන්නිවේදනයේ තහනම් කලාප හඳුන්වා දෙමින් උන්වහන්සේ පෙන්වා දී ඇත. මජ්ජිම නිකායේ එන චූළමාලුංක්‍ය සූත්‍රයේ දී (ඤාණානන්ද හිමි,2003,පි.153) සිය කාර්ය සාධනයට පරිබාහිරව සිතීම විමසීම නොකළ යුතු බව දේශනා කර ඇත. මාලුංක්‍ය තෙරුන් වහන්සේගේ සිතට නැගි ප්‍රශ්න කිහිපයකි. ලෝකය ශාස්වතද අශාස්වතද ලෝකය අන්තවත්ද අනන්තවත්ද මරණින් මතු ජීවිතයක් ඇත්ද නැත්ද යනාදිය ඒ අතර විය. එම ප්‍රශ්නවලට පිළිතුරු දීම වෙනුවට බුදුන් වහන්සේ පෙන්වා දුන්නේ සිය කාර්ය සාධනය කෙරේ ඍජුව බල නොපාන ප්‍රශ්න කෙරේ සැලකිලිමත් නොවිය යුතු බවය. එවැනි ප්‍රශ්න විචාරීම නිශ්ඵල බවය. හීයකින් විදුම් කෑ තනැත්තෙකු ප්‍රතිකාර පිණිස වෛද්‍යවරයෙකු හමුවට ගිය පසු ප්‍රතිකාර නොකොට හීයේ වේගය එය සදා ඇති ලෝහය ආදිය විමසමින් කාලය ගත කළ හොත් තුවාලකරු මිය යාමට ඉඩ ඇති බවය. සන්නිවේදනයේ නිදහස හා වපසරිය පිළිබඳ මහඟු අවවාදයක් මෙමගින් ලබාගත හැකිය.

**සාමාලෝචන හා සාකච්ඡාඃ**

මේ ලිපිය පුරා සාකච්ඡා වූයේ ඇතැම් බෞද්ධ සූත්‍ර ධර්මවල සහ බෞද්ධ සාහිත්‍යයේ අන්තර්ගත සන්නිවේදන ලක්ෂණ පිළිබඳවය. ඒ අතර සන්නිවේදනයේ සවරූපය කෙසේ විය යුතුද යන්න පෙන්වා දෙන නිදසුන් බොහොමයකි. නිවේදකයා මෙන්ම ග්‍රාහකයා කටයුතු කළ යුතු ආකාරය, සන්නිවේදනය ඵලදායී වීමට බලපාන මනෝ-භෞතික පරිසරය විස්තරාත්මකව පෙන්වා දී ඇත. සන්නිවේදන විධි, උපදේශ හා තොරතුරු සෘජුව ගෙනහැර පෑ අවස්ථා අධ්‍යහාර වූ අවස්ථාද ඒ අතර දක්නට ඇත. නූතන සන්නිවේදන ක්ෂෙත්‍රයේ ක්‍රමෝපායන්, න්‍යායන් සහ මාධ්‍ය ආචාර ධර්ම හා සාම්‍යයක් දක්වන ලක්ෂණ මෙන්ම ඒවා අතික්‍රමණය කළ සන්නිවේදන මූලධර්ම බෞද්ධ සන්නිවේදන ක්‍රමයේ දක්නට ඇත. ජාතික අනන්‍යතාවෙන් යුතු සන්නිවේදන ක්‍රමෝපායන් ගොඩනැගීමට බෞද්ධ සන්නිවේදනයෙන් ගත හැකි ආදර්ශ සුළුපටු නොවන බව කරුණු විමසීමෙන් පෙනී යයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**

කරුණානායක නන්දන, 1994, සන්නිවේදන විධි, මාධ්‍ය ප්‍රකාශකයෝ, නුගේගොඩ.

කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව, 2006, බෞද්ධ විනය අධ්‍යයන,, සදාචාර පද්ධතියක් වශයෙන් සේඛියාවල ඇති වැදගත්කම

ධම්මානන්ද හිමි, තලල්ලේ, 1979, ත්‍රිපිටකයේ සංස්කෘතික ලක්ෂණ, සමයවර්ධන

(ඤාණානන්ද හිමි,කිරිබත්ගොඩ,2003, අනුවාදය, සංයුක්ත නිකාය 1, බ්‍රාහ්මණ සංයුක්තය, උපාසක වර්ගය, කසීභාරද්වාජ සූත්‍රය පි.349)

පන්සිය පණස් ජාතක පොත 2, සංස්. 2000, කුලසූරිය ආනන්ද, මීගස්කුඹුර පුන්චිබණ්ඩා, මැද්දේගම උදය, ධම්මාලෝක වරකාවේ, සොරත පොල්ලමුරේ, 314, ජාතික පුසතකාල සේවා මණ්ඩලය.

බුද්ධශාසන අමාත්‍යංශය, 1996, සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථමාලා 4, සිංහල මැඳුම් සඟිය 3, මජ්ජිම නිකාය උපරිපණ්ණසකය

සිරිසුමන හිමි, 2011, බුදුරදුන්ගේ ඉගැන්වීමේ ශිල්ප ක්‍රම, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්, නුගේගොඩ

ලංකානන්ද හිමි, ලබුගම, (පාඨ ශෝධනය) සුමනසාර හිමි කරහන්පිටිගොඩ, (සිංහලානුවාදය) 1974, සූත්‍රපිටකය, මජ්ඣිම නිකාය තෘතීය කොටස, උපරිපණ්ණසකය ප්‍රකාශනය, ශ්‍රී ලංකා ජනරජය පි.497-512

Andal, N, 1998, Communication Theories and Models, Himalaya Publishing House Mumbai.

Gamble, Teri, Kwal, 1987, Communication works, Random house, New York.

Harcup,Tony, 2004, Journalism Principels and Pratice ,Vistaar Publication,London

Pease allan , Body Language,Sudha Publication, New Delhi,